# ලංසු කැඳවීමේ ආරාධනා

පරිසර අමාත්‍යාංශය

**රාජ්‍ය දැව සංස්ථාව**

## රාජ්‍ය දැව සංස්ථාවේ ප්‍රධාන දුරකථන පද්ධතිය (PABX පද්ධතිය) වැඩිදියුණු කිරිම නැවත සැකසීම.

## ප්‍රසම්පාදන අංකය : STC/PSM/2025/01/LP/18

01. රාජ්‍ය දැව සංස්ථාව වෙනුවෙන් දෙපාර්තමේන්තු සුළු පරිමාණ ප්‍රසම්පාදන කමිටු සභාපති විසින් 2026 වර්ෂය සඳහා රාජ්‍ය දැව සංස්ථාවේ ප්‍රධාන කාර්යාලයේ ප්‍රධාන දුරකථන පද්ධතිය (PABX පද්ධතිය) වැඩිදියුණු කිරිම වෙනුවෙන් සුදුසුකම්ලත් ලංසු කරුවන්ගෙන් මුද්‍රා තැබූ ලංසු පත් කැඳවනු ලැබේ.

02. මේ සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන සුදුසුකම් සහිත ලංසුකරුවන්ට රාජ්‍ය දැව සංස්ථාවේ කලමණාකරු මිලදී ගැණිම් හා නාවික මගින් වැඩිමනක් තොරතුරු ලබාගත හැකි අතර, පහත දැක්වෙන ලිපිනයේ දී සතියේ රාජකාරි දිනවල **2026.10.23** දින සිට **2026.11.13** දින දක්වා පෙ.ව 10.00 සිට ප.ව 3.00 දක්වා ලංසු කැඳවීමේ පෝරම ඇතුළු විස්තර පත්‍රිකා ලබා ගත හැකිය.

03. සමාගම් පනත යටතේ ලියාපදිංචි වූ නිෂ්පාදකයන්ට හෝ සැපයුම්කරුවන්ට පමණක් ලංසු ඉදිරිපත් කළ හැක.

04. මේ සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන ලංසු කරුවන් විසින් සමාගම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි සහතිකයේ සහතික කළ පිටපතක් සමඟ ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ආපසු නොගෙවන රු: 3,500.00 ක මුදලක් රාජ්‍ය දැව සංස්ථාවේ ප්‍රධාන කාර්යාලයේ මුදල් අයකැමි වෙත ගෙවීමෙන් පසු ඉංග්‍රීසි භාෂාවෙන් සකස් වී ඇති අදාළ ලංසු කැඳවීමේ ලේඛන කට්ටලයක් **2026.11.13** දින තෙක් ලබා ගත හැකිය.

05. සම්පූර්ණ කරන ලද ලංසු පත් **2026.11.16** දින ප.ව. 2.00 ට පෙර ලැබීමට සැලැස්විය යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු පත් ප්‍රතික්ෂේප කෙරේ. වර්ෂ **2026.11.16** දින **ප.ව 2.00** ට ලංසුපත් භාර ගැනීම අවසන් වූ වහාම ලංසුපත් විවෘත කරනු ලැබේ. ලංසු කරුට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකුට එම අවස්ථාවට සහභාගි විය හැකිය. සියලුම ලංසුපත් සමඟ රුපියල් 200,000.00 (ලක්ෂ දෙකක) **වටිනාකමකට නොඅඩු, මාස 03 ක වලංගු කාලයක් සහිතව (2027/02/16 දින දක්වා වලංගු) සභාපති,** රාජ්‍ය දැව සංස්ථාව **වෙත ශ්‍රී** ලංකාවේ පිළිගත් ඕනෑම වාණිජ බැංකුවකින් ලබාගන්නා කොන්දේසි විරහිත ලංසු සංරක්ෂණයක් ඉදිරිපත් කළ යුතුය. (රක්ෂණ ආවරණ පිළිගනු නොලැබේ).

06. **2026.11.05** දින ලංසුකරුවන් දැනුවත් කිරීම සඳහා පූර්ව ලංසු රැස්වීමක් රාජ්‍ය දැව සංස්ථාවේ ප්‍රධාන කාර්යාලයේ දී පෙ.ව. 10.30ට පැවැත්වීමට නියමිතව ඇති අතර, මේ සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන ලංසුකරුවන්හට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකුට එම අවස්ථාවට සහභාගි විය හැකිය.

07. ඔබගේ ලංසු ලිපි ලේඛන මුද්‍රා තැබූ කවරයක බහා, ලියුම් කවරයේ ඉහළ වම් කෙළවර " **රාජ්‍ය දැව සංස්ථාවේ ප්‍රධාන දුරකථන පද්ධතිය (PABX පද්ධතිය) වැඩිදියුණු කිරිම .''** යනුවෙන් සඳහන් කර පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන්, **2026.11.16** දින ප.ව 2.00 ට පෙර ලැබෙනසේ හෝ **2026.11.16** දින ප.ව 2.00 ට පෙර පහත ලිපිනයේ තුන්වන මහලේ මිලදී ගැනිම් හා නාවික අංශයේ තබා ඇති ලංසු පෙට්ටියට බහාලිය හැකිය.

එවිය යුතු ලිපිනය :


**සභාපති,**

**දෙපාර්තමේන්තු** සුළු පරිමාණ **ප්‍රසම්පාදන කමිටුව,**

**රාජ්‍ය දැව සංස්ථාව ,**

**අංක 80, රජමල්වත්ත මාවත,**

**බත්තරමුල්ල.**

**දු.ක. 011-2866601, ෆැක්ස් 0112866622**